C 701 RAN

# සෞන්දර්යය පිලිබඳ බෞද්ධ ආකල්පය
## (මුල් බුදු සමය ඇසුරින්)

# Buddhist Attitude To Aesthetics
## (As Revealed in Early Buddhism)

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

ආර්.ඒ. චන්ද්‍රදාස රණසිංහ
බී.ඒ. ගෞරව අධ්‍යාපන ඩිප්ලෝමා

514798

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධිය
1995

## Abstract

| | | |
|---|---|---|
| 1. | Title of the Thesis | : "Buddhist Attitude to Aesthetics" (As Revealed in early Buddhism) |
| 11. | Name of the Candidate | : R.A. Chandradasa Ranasinghe |
| 111. | Department of study | : Philosophy |
| 1v. | Degree | : Master of Arts |

The subject matter of Aesthetics is concerned with nature and beautiful creations of man. Is man sensitive to true beauty in all it's depth or does he take it only at it's face value not enjoying the higher spiritual experience which can be described as aesthetic?

In the second chapter the attempt is made to clarify different planes of aesthetic pleasure and how man responds to such beauty, and also what constitutes the mental framework of those who exhibit a higher degree of aesthetic sensibility. Here analysis is given of the mental abilities of those who have elevated themselves from lower manifestations of beauty to higher states of experience. Here study is made of such experiences from the standpoint of aesthetics.

Man as we know is very much pre-occupied with sensual pleasures and he visualizes beautiful objects from the perspective of that beauty. Here we discuss how the Buddhist responds to beauty and how he analyses from a aesthetic angle creations he encounters in the world. Also we focus attention how the Buddhist experiences reality in all its beauty.

Furthermore it is our view that in meditative trances man enters into transcendental spheres while remaining in the world itself. It is clear that experiencing aesthetic beauty from meditative trances is much superior to pleasures accrued from physical objects and we give attention to how the tipitaka canon shows how in meditative joy we come across the highest experience of beauty. The manner in which philosophical investigation can be made from the Buddhist standpoint is given in a comprehensive analysis. This is accomplished in the fourth chapter of this thesis.

How is Buddhism connected with art and how can a mind wellcontrolled and tranquilized be established in connection with what is met with in the Buddhist world. Also a comparative study of how aesthetics has developed in India and Sri Lanka will be analysed in the last chapter. In this an attempt will be made to show that Buddhism goes hand in hand with aesthetics without creating any antagonistic attitudes.

## සංක්‍ෂේපනය

බුදු දහම පිළිබඳව අදහස් දක්වන සමහර විචාරකයන්ගේ මතය වී ඇත්තේ බෞද්ධ දර්ශනයෙන් වඩා ඉස්මතු කොට දක්වන්නේ ලෝකයේ සහ මිනිසාගේ සැපය පිළිබඳව නොව දුක පිළිබඳව යන්නයි. මේ කරුණ බෞද්ධ දර්ශනය සමාජයෙන් දුරස්වන්නට ඉඩකඩ සලසයි. ඉහත සඳහන් සාවද්‍ය මතය බැහැර කරලීමටත්, බෞද්ධ දර්ශනය කොතරම් දුරට සෞන්දර්යාත්මක අංශය සමඟ මුල් යුගයේ පටන් ගමන් කොට ඇත්ද යන්න ගෙනහැර දැක්වීමත් මෙම පර්යේෂණාත්මක නිබන්ධයේ අරමුණ වී ඇත.

මෙහිදී මූලික බුදු සමයේ ත්‍රිපිටකාගත අදාළ සූත්‍ර පාදක කර ගනිමින් බුදුන් වහන්සේත්, රහතන් වහන්සේලාත් , භික්‍ෂු භික්‍ෂුණීන් වහන්සේලාත් සෞන්දර්යාත්මක අංශය කෙරෙහි දක්වා ඇති සුභවාදී ආකල්පය විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කර ඇත. ඒ සඳහා ථෙර සහ ථෙරී ගාථාද බෙහෙවින් උපයෝගී කරගෙන ඇත. එමෙන්ම සෞන්දර්යය අනුභූතිය යනු කුමක්ද යන්න සහ එහි විවිධ වින්දනීය ස්තර දක්නට ලැබේද යන්නත් විමර්ශනාත්මකව ඉදිරිපත් කර ඇත. සෞන්දර්යාත්මක වින්දනීය ස්තරවල විවිධ මට්ටම් බෙදා දැක්වීමේදී හැකි තාක් ස්වාධීන අදහස් ඇතුලත් කළෙමි.

පසිඳුරන්ගෙන් යුත් මිනිසා අනුභූතිමත් කරන කාම විඳෙනයන් කෙතෙක් දුරට සෞන්දර්යාත්මක අංශයට සම්බන්ධ වන්නේද යන්නත් , එහිදී පුද්ගල චර්යාමය ස්වභාවය සෞන්දර්යාත්මක අනුභූතිය කෙරෙහි දක්වන ආකල්පය කවර ආකාර වූවක්ද යන්නත් බොහෝ දෙනෙකු අමතක කරලන ක්ෂේත්‍රයකි. එමෙන්ම බෞද්ධ භාවනාවෙන් ලබන ධ්‍යාන තත්වයන්හිදී විරාගී පුද්ගලයන් කෙබඳු උසස් සෞන්දර්යමය වින්දනයක් ලබන්නේද යන්නත් සොයා බැලීම අමතක කර දමා ඇති තවත් අංශයකි. ධ්‍යානගත සහ නිර්වාණගාමී ඵලයට පත් උතුමන් වර්තමානයේ ප්‍රකටව දක්නට නොලැබෙන නිසා ධ්‍යාන සහ නිවන වැනි අධ්‍යාත්මගත ඵලයන් හුදු න්‍යායාත්මක අංශ පමණක්ය යන මතය මෙම ක්ෂේත්‍ර අමතක වීමට හේතුවී ඇතැයි සිතේ. එහෙත් බුදු දහම යනු න්‍යායාත්මක පමණක් නොව ප්‍රායෝගික දර්ශනයකින්ද යුත් ක්‍රියාමාර්ගයකි. එය

බුදුන් වහන්සේම ප්‍රකාශ කොට ඇත. මේ නිසා එම අදහස් ඉස්මතු වන ආකාරයට ධ්‍යාන සහ සමාපත්ති පිළිබඳවත් ඒ ඒ පුද්ගලයන්ගේ වින්දනීය තත්වයනුත් අදාළ සූත්‍ර ඇසුරින් විමර්ශනයට ලක්කර ඇත.

එමෙන්ම බෞද්ධ කලාව බෞද්ධ දර්ශනය සමග සුසංයෝගීව බුද්ධ කාලයේ පටන් වර්තමානය දක්වාම ගමන්කර ඇති බව පෙන්වීමටත් අවසන් පරිච්ඡේදයේ දී උත්සාහ දරා ඇත.

මෙම පර්යේෂණාත්මක නිබන්ධයේදී යොදාගත් මූලාශ්‍ර අතර ත්‍රිපිටකාගත සූත්‍ර මූල්තැනක් ගත් අතර අදාළ පරිදි වෙනත් කෘති සහ සඟරා ද උපයෝගී කර ගතිමි. අවසන් වශයෙන් දැක්විය යුතු කරුණ වන්නේ මෙම පර්යේෂණාත්මක නිබන්ධයේ මූලික අභිමතාර්ථය වූයේ බුදු දහම ප්‍රායෝගික ලෝකය සමග සැමදා ඉදිරියට ගමන් කළයුතු මට්ටමේ උසස් දර්ශනයක් බව ප්‍රකට කරලීමයි.

UNIVERSITY OF PERADENIYA
6-7-1999
LIBRARY